# 13 ශ්‍රේණිය

**ලකුණු පිරිනමන ආකාරය**

**ව්‍යාපාර අධ්‍යයනය I**

| | | | |
|---|---|---|---|
| බහුවරණ 30යි. | ලකුණු 02 බැගින් | - | 60 |
| හිස්තැන් පිරවීම 10 | ලකුණු 02 බැගින් | - | 20 |
| නිශ්චිත කෙටි පිළිතුරු 10 | ලකුණු 02 බැගින් | - | 20 |
| | | | 100 |

**ව්‍යාපාර අධ්‍යයනය II**

අ. කොටස - ප්‍රශ්න 04යි

ආ. කොටස - ප්‍රශ්න 04යි

එක් කොටසකින් ප්‍රශ්න 02ක්වත් තෝරා ගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුය.
1 සිට 8 දක්වා ප්‍රශ්න 08 යි. සෑම ප්‍රශ්නයක් ම කොටස් 05 කින් යුක්ත වේ.
කොටසකට ලකුණු 04 බැගින් ප්‍රශ්නයකට ලකුණු 20 යි.
මුළු ලකුණු ප්‍රශ්න 05ට ලකුණු 20 බැගින් - 100

| | | |
|---|---|---|
| **I හා II පත්‍රය සඳහා** | **-** | **200** |
| **අවසාන ලකුණු** | **-** | **100** |

**13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය**
**I පත්‍රය**

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | 2 | (21) | 3 |
| (2) | 3 | (12) | 3 | (22) | 3 |
| (3) | 4 | (13) | 5 | (23) | 4 |
| (4) | 5 | (14) | 5 | (24) | 4 |
| (5) | 4 | (15) | 4 | (25) | 1 |
| (6) | 1 | (16) | 5 | (26) | 5 |
| (7) | 4 | (17) | 1 | (27) | 1 |
| (8) | 4 | (18) | 2 | (28) | 4 |
| (9 | 2 | (19) | 4 | (29) | 4 |
| (10) | 3 | (20\|) | 1 | (30) | 2 |

31) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම
සම්පත්වලට අගය එකතු කිරීම
(ආ) අධි චක්‍රීකරණය - අඩු වටිනාකමක් ඇති ද්‍රව්‍ය ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදන බවට පත්කිරීම
අව චක්‍රීකරණය- ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදන අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය බවට පත්කිරීම

32) (අ) සාර්ව ආර්ථික ස්ථායිතාවය ආරක්ෂා කර ගැනීම
(ආ) අභ්‍යන්තර මිල ස්ථායිථාව, බාහිර මිල ස්ථායිතාව

33) (අ) නිෂ්පාදන වරලත් ව්‍යාපාර , ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර
(ආ) විකුණුම්/ නිවැවුම් , පුරස්කාරය

34) (අ) ලෝක බැංකුවේ
(ආ) උතුරු ඇමෙරිකානු නිදහස් වෙළඳ ගිවිසුම

35) (අ) අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපොළ
(ආ) විකුණුම් ප්‍රවර්ධනය

36) (අ) ඇණවුම් කිරීමේ පිරිවැයත්, තොග පවත්වාගෙන යාමේ පිරිවැයත්
(ආ) ස්ථිර , තාවකාලික

37) (අ) පෞද්ගලික
(ආ) මූල්‍ය විශ්ලේෂණය

38) (අ) වාණිජ පත්‍රිකා

(ආ) සාංගමික බැඳුම්කර

39) (අ) ශ්‍රම පිරිවැටුම / සේවක පිරිවැටුම

40) (අ) දත්ත, තොරතුරු

(ආ) අනුස්ථාපනය , පරිවාස

41) 1. සමාගම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය.

2. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය

3. සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ක්‍රියාකිරීමට එක් එක් ආරම්භක අධ්‍යක්ෂකවරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය

4. සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීමට කැමති බවට ආරම්භක ලේකම්වරයාගේ ප්‍රකාශය

42) 1. තනතුර මත නීත්‍යානුකූලව ලැබෙන බලය

2. විශේෂඥ බලය

3. ත්‍යාග දීම සඳහා ඇති බලය

4. ඇණවුම් දීමට ඇති බලය

5. බලපෑම් කිරීමේ බලය

43) 1. තීරණ ගැනීම වේගවත් වීම

2. තීරණවල ඒකීයත්වයක් පැවතීම

3. පාලන කාර්ය පහසුවීම.

4. සන්නිවේදනය පහසු වීම.

5. පිරිවැය අඩු වීම.

44) 1. දැනුම

2. කුසලතා

3. ආකල්ප

4. ශාරීරික යෝග්‍යතාවය

45) 1. සේවයට නොපැමිණීම

2. සේවයට වාර්තා කර සේවය නොසැපයීම

3. විවේක කාලය වැඩිපුර ගැනීම.

4. ප්‍රමාද වී සේවයට පැමිණීම

5. නියමිත වේලාවට පෙර සේවා ස්ථානයෙන් පිට වී යාම.

46) 1. තත්කාලීන දළ පියවීම් පද්ධතිය

2. ඡායාගත පිළිබිඹු චෙක්පත් නිෂ්කාශන පද්ධතිය

3. නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය

4. ජගත් අන්තර් බැංකු සන්නිවේදන සංගමය

47) 1. පළාත් සභාන නගර සභා ප්‍රාදේශීය සභා යටතේ පවත්වා ගෙන යාම.
2. අයිතිය ඒ ඒ පළාත් පාලන ආයතනයට හිමි වීම.
3. අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතනය විසින් හෝ මධ්‍යම රජයෙන් සපයනු ලැබීම.
4. පරිපාලනය පළාත් පාලන අධිකාරීන් විසින් සිදු කිරීම.

48) 1. ලෝක වෙළඳ සංවිධානය (WTO)
2. සාර්ක් සංවිධානය (SAARC)
3. ආසියානු සංවර්ධන බැංකුව (ADB)
4. ලෝක බැංකුව (IBRD)
5. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)

49) 1. හස්ත ක්‍රමය (අත්හුරු ක්‍රමය)
2. අර්ධ හස්ත
3. විද්‍යුත් යාන්ත්‍රික
4. විද්‍යුත්

50) 1. පැහැදිලි ඉම
2. ගනුදෙනුකරුවෝ
3. ඉලක්ක
4 අවශ්‍ය මූල්‍ය සම්පත්

## <u>II කොටස</u>

01. (අ) 1. නවීන විලාසිතාවන්වලින් යුත් ඇඳුම් නිර්මාණය කිරීම
2. මිල පිළිබඳ සැළකිලිමත් වීම
3. නව්‍ය බව

(කරුණු 02ට ලකුණු 1 ᳵ 2 = ලකුණු 02)

(ආ) විකුණුම් උපරිම කිරීම
ලාභය උපරිම කිරීම

(කරුණු 02ට ලකුණු 1 ᳵ 2 = ලකුණු 02)

ii. යෙදවුම් ⟶ ක්‍රියාවලිය ⟶ නිමවුම

භූමිය
ශ්‍රමය
ප්‍රාග්ධනය
ව්‍යවසාය
දැනුම
කාලය
තොරතුරු
} ⟶ 
නිෂ්පාදනය
අලෙවිකරණය
පරිපාලනය
මූල්‍ය කටයුතු
මානව සම්පත් කටයුතු
} ⟶ ඇගලුම්

(අදාළ පරිදි උදාහරණ මගින් පැහැදිලි කිරීමට ලකුණු 04)

iii. (අ) දක්ෂ සේවිකාවන් දෙදෙනෙකු සිටීම
මෝස්තර නිර්මාණය කිරීමේ හැකියාව

(කරුණු 02ට ලකුණු 1 ᳵ 2 = ලකුණු 02)

(ආ) විද්‍යුත් වෙළඳාම (නම් කිරීමට ලකුණු 01)

(පැහැදිලි කිරීමට ලකුණු 01)

iv. (අ) 1. අයිතිකරුවෝ - ආයෝජකයාට ප්‍රමාණවත් ලාභයක් ලැබේදැයි දැන ගැනීමට

- වෙළඳපොළ කොටස දැන ගැනීමට
- ව්‍යාපාරයේ වර්ධනය පිළිබඳ දැන ගැනීමට

2. සේවකයෝ - ඉහළ වැටුපක් ලබා ගැනීමට

- ප්‍රසාද දීමනා ලැබේදැයි දැනගැනීමට
- රැකියාවේ උසස්වීම් ලැබේදැයි දැන ගැනීමට

(කරුණු 02ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

(ආ) ශක්තීන් හඳුනාගැනීමට

දුර්වලතා අවම කර ගැනීමට

අවස්ථා භාවිතයට ගැනීමට

තර්ජනවලට සාර්ථකව මුහුණ දීමට (කරුණු 02ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

iv. 1. වෙනස්වන සංකීර්ණ වුවමනා සපුරාලීම

2. නවෝත්පාදනය
3. රැකියා උත්පාදනය
4. ජාතික ආර්ථික වර්ධනය

(කරුණු 04ට ලකුණු 02)

(පැහැදිලි කිරීමට ලකුණු 02)

02. i. 1. රැකියා නියුක්තියට දායක වීම.

2. බදු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරීම.
3. අපද්‍රව්‍ය කළමනාකරණය
4. ප්‍රජා සත්කාර සේවා
5. හරිත නිෂ්පාදිත
6. පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම (කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

ii. (අ) තිරසර සංවර්ධනය යනු, අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝණය නොකරමින් වර්තමාන අවශ්‍යතා ලගාකර ගන්නා වූ සංවර්ධනයයි.

(ලකුණු 02)

(ආ)1. සම්පත් පරිභෝජනය

2. අමුද්‍රව්‍ය හා අපද්‍රව්‍ය කළමනාකරණය
3. අවදානම් කළමනාකරණය
4. ස්වභාවික හා සංස්කෘතික උරුමයන් සුරැකීම.

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

iii. (අ) ව්‍යාපාර තමන් සමග කටයුතු කරන සියලු පාර්ශවයන්ට යහපතක් සිදු වන ආකාරයට හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම වේ.

(ලකුණු 02)

(අ) සමාජ සංස්කෘතිය යනු ජන වර්ගය තුළ මුල් බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම් උප සංස්කෘතීන් ගැන සැළකිලිමත් වෙමින් ආචාර ධර්ම පද්ධතිය සැකසීමයි.

සංවිධාන සංස්කෘතිය යනු ව්‍යාපාර ආයතනය තුල පවතින චාරිත්‍ර වාරිත්‍ර, වටිනාකම් , පුරුදු, ආකල්ප පිළිබඳ සැලකිලිමත් වීම ය.

(ලකුණු 1 බැගින් 1 ඃ 2 = ලකුණු 02)

iv. (අ) 1. ආර්ථික වර්ධනය හා සංවර්ධනය
2. පූර්ණ සේවා නියුක්තිය
3. සාධාරණ ආදායම් ව්‍යාපෘතිය
4. ආර්ථික ස්ථායීතාවය
5. යහපත් අන්තර් ජාතික වෙළඳාම

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ)1. රජය ව්‍යාපාරවලට පහසුකම් සැපයීම තුළින් ව්‍යාපාර දිරිමත් වීම.
2. ව්‍යාපාර වර්ධනය තුලින් ආර්ථික අරමුණු ඉටු වීම.
3. බදු ආදායම් ලබා ගැනීමට හැකි වීම.
4. බදු ආදායම් යටිතල පහසුකම් සංවර්ධනයට යොදාගත හැකි වීම.

(කරුණු පැහැදිලි කිරීමට 1/2 ඃ 4= ලකුණු 02)

v. (අ) ආර්ථික ස්ථායීතාවය යනු ආර්ථිකයේ දේශීය හා විදේශීය වශයෙන් අර්බුධයක් ඇති නොවීමට ඔරොත්තු දීමේ හැකියාව වේ.

(ලකුණු 02)

(ආ)1. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය
2. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය
3. බැංකු පොලී අනුපාතිකය

කරුණු 02ට ලකුණු 1/2 ඃ 2 = ලකුණු 01)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 2 = ලකුණු 01)

03. i. (අ)1. හවුල්කරුවන් අවමය දෙකක් හා උපරිමය 20කට සීමා වීම
2. හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතු වීම.
3. ලාභ බෙදා ගැනීම සඳහා වූ එකගත්වයක් දැකිය හැකි වීම.
4. අන්‍යෝන්‍ය නියෝජත්වය
5. කිසියම් ව්‍යාපාර කටයුත්තක් පැවතීම.

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ) 1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලුම් පත්‍රයක් ලබා ගැනීම.
2. ග්‍රාම නිළධාරී මහතාගෙන් ව්‍යාපාර ලියාපදිංචි කිරීඹට අදාළ වාර්තාව ලබා ගැනීම.
3. ග්‍රාම නිළධාරී වාර්තාව හා ඉල්ලුම් පත ලියාපදිංචි ගාස්තු ද සමග ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දීම.
4. ප්‍රාදේශීය ලේකම් විසින් ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම.

(ලකුණු 02)

ii.(අ) 1. කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම.
2. සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමක දී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වීම.
3. අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකුවත් සිටිය යුතු වීම හා උපරිමය පිළිබඳ සීමාවක් නොවීම.

4. පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම.
5. සමාගමේ ලාභ බෙදා හැරීමක් නොකිරීම.

(කරුණු 02ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

(ආ) 1. ලියාපදිංචි ගාස්තු ලෙස ලෙස හා ලාභාංශ හරහා රට තුලට විදේශ විනිමය ගලා ඒම
2. ශ්‍රී ලාංකික ව්‍යාපාරික කීර්තිනාමය විදේශවල පැතිරීම.
3. ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි භාවිතය නිසා ඒවාට බදු කුලී, දේපල වැනි ආදායම් ලැබීම.
4. ශ්‍රී ලාංකිකයන්ට දෙස් විදෙස් රැකියා අවස්ථා හිමි වීම.

කරුණු 02ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

iii.(අ) සාමාජිකත්වය - කොටස් මිලදී ගැනීමෙන් සාමාජිකත්වය ලබා ගත හැකිය. කොටසක වටිනාකම රු. 100/- කි. අවම සාමාජිකයින් 10කි.

ප්‍රාග්ධනය - සාමාජිකතවියට කොටස් විකිණීමෙන් හා රජයේ අරමුදල් ලබා ගැනීම මගින් සපුරාගන්නකි

ලියාපදිංචිය - 1972 අංක 05 දරණ සමූපකාර පනත යටතේ සමූපකාර කොමසාරිස්වරයා සිදු කරයි.

වගකීම - සාමාජිකයින් මිලට ගත් නාමික අගයට සීමා වි.

(කරුණු 04ට ලකුණු 1 ඃ 4 = ලකුණු 04)

v.(අ) 1. අවදානම් කළමනාකරණය කිරීමේ හැකියා නිසා ව්‍යාපාර ආරම්භ කළ හැකි වීම.
2. ව්‍යවසායකයින්ගේ උනන්දුව හා කැපවීම මත ව්‍යාපාර සාර්ථක වීම.
3. ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට බලපෑම
4. ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමෙන් ව්‍යාපාර සාර්ථක කරගත හැකිවේ.

කරුණු 02ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

(ආ) පොලිතීන් වෙනුවට දිරාපත් වන ඇසුරුම් ද්‍රව්‍ය භාවිතා කරමින් ඇසුරුම් නිෂ්පාදනය කිරීමට දේශීය ව්‍යාපාරිකයන් උනන්දු කිරීමට මෙම ණය ලබා දේ.

(ලකුණු 02)

v. (අ) ඒකාබද්ධ වීම
අත්පත්කර ගැනීම

(කරුණු 02ට ලකුණු 1/2 ඃ 2 = ලකුණු 01)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 2 = ලකුණු 01)

(ආ) 1. විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම.
2. නෛතික පුද්ගලභාවයක් හිමි වීම.
3. පූර්ණ අයිතිය හෝ වැඩි අයිතියක් රජය සතු වීම.
4. රජය විසින් පත් කරන අධ්‍යක්ෂක මණ්ඩලයකින් පාලනය කිරීම.
5. රාජ්‍ය ණය, ලාභාංශ, පති ආයෝජන හා මහජනතාව ණය ප්‍රාග්ධනයට දායක කර ගැනීම ආදියෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම.

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 2 = ලකුණු 02)

04. i. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය
ජගත් අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන ජාලය
තත්කාලීන දළපියවී පද්ධති
ලේඛන රහිත සුරැකුම් තැන්පතු පද්ධති

කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 4 = ලකුණු 02)

ii.(අ) චෙක්පතෙහි මුහුණත සඳහන් වන ආකාරයට ම ආදායකයා තම නම චෙක්පත පිටුපස ලිවීමයි.

(ලකුණු 1/2)

(ආ)1. ආදායකයා විසින් චෙක්පතබැංකුවේ තැන්පත් කිරීමේ දී

2. විධාන චෙක්පතක් නම් අන් අයකුට පවරන අවස්ථාවේ දී

3. රේඛනය නොකරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේ දී

(කරුණු 03ට ලකුණු 1/2 ඃ 3 = ලකුණු 1 1/2)

iii.(අ)1. නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස

2. අර්පනය හෙවත් යෝජනාව

3. ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම

4. නෛතික බව

5. ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව

කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ) ප්‍රතිරක්ෂණය යනු, රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවධානමක් එම ආයතනය විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම යි.

ප්‍රාරක්ෂණය යනු, විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් ඇති අවධානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීමයි.

(ලකුණු 1 බැගින් ලකුණු 02)

iv(අ) 1. වෙළඳ ගනුදෙනුවලදී අදාළ පාර්ශව අතර අදහස් හුවමාරු කර ගැනීමට

2. සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගැනීමට

3. මානව හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම.

4. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා

කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ) 1. ගොඩනැගිල්ලේ පිරියත සැලැස්ම හා ගොඩනැගිල්ල තුල චලනය කිරීමේ ඉඩකඩ

2. ද්‍රව්‍ය භාවිතයේ වේගවත් බව හා ගබඩාව තුළ කලාප වෙන් කිරීමේ අවශ්‍යතාව

3. ප්‍රධාන සම්බන්ධතා වලට ආසන්න බව

4. ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව

5. ගබඩා කරන ද්‍රව්‍යයේ ස්වභාවය

(කරුණු 02ට ලකුණු 1/2 ඃ 2 = ලකුණු 01)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 2 = ලකුණු 01)

v(අ) අතරමැදියන් යොදා ගැනීමේ වාසි

1. විවිධ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ලබාගෙන අවශ්‍ය වේලාවට අවශ්‍ය ස්ථානවලට ලබා දීම.

2. නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම පහසු වීම.

3. වෙළඳපොළ තොරතුරු අදාළ පාර්ශවයන්ට පහසුවෙන් ලබාගත හැකි වීම.

4. හුවමාරු ක්‍රියාවලිය සරල වීම.

අවාසිඃ-

1. වෙළඳපොළේ අනවශ්‍ය භාණ්ඩ හිගයක් ඇති විය හැකි වීම.

2. භාණ්ඩවල මිල ගණන් ඉහළ යා හැකි වීම.

වාසි 2කට ලකුණු 1/2 ඃ 2 = ලකුණු 01)

(අවාසි 2කට ලකුණු 1/2 ඃ 2 = ලකුණු 01)

(ආ)1. ස්වාභාවික සම්පත් බෙදී යාමේ විෂමතාවය
2. සාපේක්ෂ පිරිවැය වාසිය
3. සමහර නිෂ්පාදිත සමබිනධව සමහර රටවලට නීතිමය ඒකාධිකාරයක් තිබීම.
4. භාණ්ඩ ප්‍රවර්ධනය
5. වෙළඳ භාධක අවම වීම

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

## II කොටස

05. i. **අග්‍ර කළමනාකරුවෝ**

- සංවිධානයක පරමාර්ථ හා අරමුණු ස්ථාපිත කිරීම.
- උපාය මාර්ග හා ප්‍රතිපත්ති තීර්ණය කිරීම.
- ආයතනයේ සමස්ථ ක්‍රියාවලිය තීර්ණය කිරීම.
- මධ්‍ය මට්ටමේ කළමනාකරුවන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම.

**මධ්‍ය කළමනාකරුවෝ**

- අග්‍ර සහ පළමු පෙළ කළමනාකරුවන් අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- අග්‍ර කළමනාකරණයට තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම
- පළමු පෙළ කළමනාකරුවන්ගේ කටයුතු අධීක්ෂණය හා පාලනය
- අග්‍ර කළමනාකරුවන් විසින් සකස් කරන සැළසුම් ක්‍රියාත්මක කිරීම.

**පළමු පෙළ කළමනාකරුවෝ**

- ඉහළ හා මධ්‍ය කළමනාකරුවන්ගේ සැළසුම් හා නියෝග ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරුවන් නොවන සේවකයින්ගේ කටයුතු අධීක්ෂණය හා පාලනය

(කළමනාකරුවන් වර්ග කිරරීට ලකුණු 01)

(කාර්යන් 02 ලකුණු 1 බැගින් ලකුණු 03)

ii.(අ)1. පැහැදිලිව නිශ්චය කරගත් අරමුණු හා පරමාර්ථ මත පදනම් වීම.
2. නිශ්චිත කාලසීමාවක් සඳහා සීමා වීම.
3. ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකි වීම.
4. නම්‍යශීලී වීම
5. ආයතනයේ සෑම මට්ටමකටම සේවකයන්ට තේරුම් ගත හැකි බව
6. ප්‍රමුඛත්වය
7. සෑම මට්ටමකමකළමනාකරුවන්ගේ කැපවීම හා සහභාගිත්වය අවශ්‍ය වීම.
8. කාර්යක්ෂමතාවය රැකිය යුතු වීම.

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ) 1. ප්‍රමිති ස්ථාපිත කිරීම
2. කාර්ය ඵල මැනීම
3. විචලනය හඳුනා ගැනීම
4. ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

iii.(අ) ආයතනයක සමාන මටම්මේ තනතුරු අතර සිදුවන සන්නිවේදනය වේ. (ලකුණු 02)

(ආ)1. නිෂ්පාදිතයේ ස්වභාවය
2. වෙළඳපොළ ප්‍රමාණය
3. යොදාගන්නා තාක්ෂණය හා අවශ්‍ය ලක්ෂණ

4. දැරිය යුතු පිරිවැය
5. මිලදී ගැනීමේ රටාව
6. සම්පත් ලබා ගැනීමේ පහසුවලබා ගැනීමේ පහසුව

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

iv (අ) **වාසි**

1. කාණ්ඩයෙන් කාණ්ඩයට නිෂ්පාදිතයේ නිමාව වෙනස් කළ හැකි වීම
2. ඇණවුම් නිෂ්පාදනයට සාපේක්ෂව ඒකකයට පිරිවැය අවම වීම
3. සාපේක්ෂ විශාල තොග වශයෙන් නිෂපාදනය කළ හැකි නිසා පිරිවැටුම ඉහළ යාම.

**අවාසි**

1. කාණ්ඩයෙන් කාණ්ඩයට යන්ත්‍ර හා උපකරණ නැවතසැකසීමට සිදු වීම නිසා පිරිවැය වැඩි වීම.
2. ප්‍රවාහ නිෂ්පාදනයට සාපේක්ෂව ඒකකයක පිරිවැය වැඩිවීම.
3. මහා පරිමාණ පිරිමැසුම් අඩු වීම.

(වාසි හා අවාසි 2කට ලකුණු 02)

v.(අ)1. නිෂ්පාදන සැළසුම්කරණයට මෙන්ම මිල නියම කිරීමේ දී ප්‍රයෝජනවත් වීම.
2. නිමවුමේ හෝ අලෙවියේ විවිධ මට්ටම්වලදී ලාභය හෝ අලාභය පෙන්නුම් කළ හැකි වීම.
3. ව්‍යාපාර ආදායම, පිරිවැය සහ මිල යන අංශවල ඇතිවන වෙනස්වීම් විග්‍රහ කළ හැකි වීම.
ලෙස භාවිත කළ හැකි වීම.
4. ව්‍යාපාර කටයුතු සැළසුම් කිරීම සඳහා පිරිවැය හා නිෂ්පාදන ප්‍රමාණය පාලනය කිරීමේ උපකරණයක් ලෙස භාවිත කළ හැකි වීම.
5. ආරක්ෂිත ආන්තිකය සොයා ගැනීමෙන් විකුණුම් පහත වැටීමේ අවදානම් ස්වරූපය තේරුම්ගත හැකිවීම.

(කරුණු 02ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

(ආ)1. පුහුණු සේවකයින් යොදා ගැනීම
2. සේවකයින් පුහුණු කිරීම
3. මූල්‍ය හා මූල්‍ය නොවන දිරිගැන්වීම් යොදා ගැනීම
4. තත්ත්ව කව යොදා ගැනීම
5. මනා සේවක සම්බන්ධතා පවත්වා ගැනීම

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

06. i. 1. පරිගණක ආධාරක නිර්මානකණය
2. පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය
3. පරිගණක සමෝද්ධානික නිෂ්පාදන ක්‍රමය
4. පරිගණක ආන්තික පාලන

(නම් කිරීමට 1/2 ඃ 4 = ලකුණු 02)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 4 = ලකුණු 02)

ii.(අ)1. නියමිත ගුණත්වයෙන් යුතු භාණ්ඩ සැපයිය හැකි වීම.
2. හානිවීම් හා පළුදු වීම් අඩුකර ගැනීමට හැකිවීම නිසා , අපතේ යාම් අඩුකර ගත හැකි වීම.
3. තරගකාරීත්වයට සාර්ථකව මුහුණ සීමට හා අඛණ්ඩව වෙළඳපොළ තුල රැඳී සිටීමට හැකිවීම.
4. පාරිභෝගික තෘප්තිය ඉහළ යාම නිසා
5. නෛතික තත්ත්වයන්ට අනුූව කටයුතු කළ හැකි වීම.
6. ලාභදායිත්වය වර්ධනය වීම හා ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම.

7. සමස්ථ පිරිවැය අවම වීම.

8. වෙළඳපොළට පහසුවෙන් පිවිසිය හැකි වීම.

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ) තත්ත්ව කව

ශූන්‍ය දෝෂ

තත්ත්ව ආරක්ෂණය

ගුණාත්ව ප්‍රමිති

සංඛ්‍යාත්මය ක්‍රියාවලි පාලනය

(නම් කිරීමට 1/2 ඃ 4 = ලකුණු 02)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 4 = ලකුණු 02)

iii.(අ) ආයතනයක් යම්කිසි මුදලක් ගෙවා වෙළඳ දැන්වීම් පල කිරීම ගෙවන ලද මාධ්‍ය වේ.

පාරිභෝගිකයන් හෝ බාහිර පුද්ගලයන් ස්වේච්ඡාවෙන් ආයතනයේ සන්නම් පිළිබඳ ප්‍රචාරණ කිරීම.

(ලකුණු 1 බැගින් ලකුණු 02)

(ආ)1. සමස්ථ වෙළඳපොලට විශ්ලේෂණයට භාජනය කෙරෙන නිසා වෙළඳපොල පිළිබඳ හොඳ අවබොධයක් ලබ ගත හැකි වීම.

2. උචිත හා නවීන වෙළඳපොළ අවස්ථ හඳුනාගත හැකි වීම.

3. ආයතනය සතු සීමිත සම්පත් සඵලදායී හා කාර්යක්ෂම ලෙස යොදා ගැනීමට හැකි වීම.

4. ආයතනයට වෙළඳපොළ පිළිබඳව ඇති අවධානම අවම කරගත හැකි වීම.

5. අලෙවිකරණ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වීම

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

iv. ව්‍යාපාර ආයතනයක වඩා උසස් ප්‍රතිඵල ලබා ගැනීමට අලෙවිකරණයේ සියලූම සංරචක එකම අරමුණකින් ක්‍රියාත්මක කළ යුතු බව මින් අදහස් වේ . මෙහි දී,

1. සම්බන්ධතා අලෙවිකරණය

2. සමෝදානික අලෙවිකරණය

3. අභ්‍යන්තර අලෙවිකරණය

4. කාර්යසාධන අලෙවිකරණය කෙරෙහි අවධානය යොමු කරයි.

(අංශ හතර සඳහන් කිරීමට 1/2 ඃ 4 = ලකුණු 02)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 4 = ලකුණු 02)

v.(අ)1. නිෂ්පාදනයේ ස්වභාවය

2. ඇසුරුමෙන් නිෂ්පාදිතයාට ලැබෙන ප්‍රයෝජන

3. තාක්ෂණික යෝග්‍යතාවය

4. ඇසුරුමේ අංශ

5. වෙළෙන්දාට ඇති පහසුව

6. පාරිභෝගිකයාට ඇති පහසුව හා ප්‍රයෝජන

7. පරිසර හිතකාමී බව

8. ඇසුරුම සඳහා වැයවන පිරිවය (කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ)ප්‍රචාරණය යනු අනාගත ඉල්ලුම වර්ධනය කර ගැනීමේ අදහසින් කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳව නිශ්චිත අනුග්‍රාහකයෙකු විසින් පිරිවැයක් දරා පෞද්ගලිකවම කරනු ලබන තොරතුරු ඉදිරිපත් කිරීම වේ.

(ලකුණු 02)

07. i. අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ග

1. රඳවාගත් ලාභ
2. ක්ෂය වෙන් කිරීම්
3. අතිරික්ත වත්කම් විකිණීම
4. කාරක ප්‍රාග්ධනය දැඩිව පාලනය කිරීම (කරුණු 0ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගවල සීමා

1. විශාල අරමුදල් ප්‍රමාණයක් සපයා ගැනීමට නොහැකි වීම.
2. කාරක ප්‍රාග්ධන ගැටලු මතු වීම.

(කරුණු 02ට ලකුණු 1 ඃ = ලකුණු 02)

ii. (අ) ආයෝජන තීරණ

මූල්‍යන තීරණ

(කරුණු 2ට 1/2 ඃ 2 = ලකුණු 01)

(පැහැදිලි කිරීමට 1/2 ඃ 2 = ලකුණු 01)

(ආ) 1. අවශ්‍ය අරමුදල් ප්‍රමාණය
2. අරමුදල් අවශ්‍ය වන කාලය
3. පිරිවැය
4. ව්‍යාපාර සංවිධානයේ ව්‍යුහයට වන බලපෑම
5. ව්‍යාපාරයේ ප්‍රාග්ධන ව්‍යුහයට වන බලපෑම
6. අරමුදල් යොදවන ව්‍යාපෘතියේ ස්වභාවය හා ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ
7. ව්‍යාපාරයේ කළමනාකරණයට සිදුවන බලපෑම

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

iii. ඍජු ප්‍රතිලාභ

ලාභාංශ

පොලී

සංචිත ප්‍රාග්ධනීකරණය

හිමිකම් නිකුතුව

ප්‍රාග්ධන ලාභ (කරුණු 02ට ලකුණු 1/2 ඃ 2 = ලකුණු 01)

පැහැදිලි කිරීමට ලකුණු 01

වක්‍ර ප්‍රතිලාභ

1. සමාගමක ඡන්ද බලය හිමි වීම හා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්විය හැකි වීම.
2. රජයේ සුරැකුම්පත් ඇප සුරැකුම් ලෙස භාවිතා කළ හැකි වීම.
3. රජයේ සුරැකුම්පත්වල කරන ආයෝජනයේ අවදානමඉතා අඩු මට්ටමක පැවතීම හා ඉහළ ද්‍රවශීලතාවයක් පැවතීම.
4. ප්‍රාග්ධන ලාභ බදුවලින් නිදහස් වීම
5. ප්‍රසාද කොටස්වලට හිමිකම් කීම (කරුණු 02ට ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

iv (අ)

| | රැකියා විස්තරය | රැකියා පිරිවිතරය |
|---|---|---|
| 1 | රැකියාව විස්තර කරයි | රැකියාවේ නියුක්ත වීමට යෝග්‍ය පුද්ගලයා විස්තර කරයි. |

| | | |
|---|---|---|
| 2 | රැකියාවට අයත් කටයුතු, රාජකාරි හා වගකීම් විස්තර කරයි. | පුද්ගලයාට තිබිය යුතු මූලික සුදුසුකම විස්තර කරයි. |
| 3 | රැකියාවේ ගති ලක්ෂණ පිළිබඳ ලේඛනයකි | රැකියාව සාර්ථකව ඉටු කිරීමට තිබිය යුතු ගති ලක්ෂණ |
| 4 | රැකියා විස්තරයේ කොටසතක් ලෙස රැකියා පිරිවිතරය අඩංගු වේ. | රැකියා පිරිවිතරයේ කෙටසක් ලෙස රැකියා විස්තරය අඩංගු නොවේ. |

(කරුණු 02 ලකුණු 02)

(ආ) වාසි

1. නව දැනුම ඇති පුද්ගලයන් ආකර්ශණය කරගත හැකිවීම.
2. තනතුරු සඳහා යෝග්‍යතම පුද්ගලයන් බඳවා ගත හැකි වීම.
3. පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීමෙන් පුහුණුව හා සංවර්ධනය සඳහා වැයන පිරිවැය අඩුවීම

(කරුනු 02ට ලකුණු 02)

v.(අ)1. සේවය අවසන් කිරීම
2. වාචිකව හා ලිඛිතව අවවාද කිරීම
3. පරිවාස කාලය දීර්ඝ කිරීම
4. සේවකයා වෙනත් අංශයකට මාරු කිරීම.

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ) දැනුම
ආකල්ප
කුසලතා
ශාරීරික හා මානසික යෝග්‍යතාව (කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

08. i. (අ) උසස් කිම
මාරු කිරීම
නවතාලීම
සේවය අවසන් කිරීම (කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ) 1. සේවාදායකයාගේ චිත්ත ධෛර්ය ඉහළ යාම
2. සේවක ප්‍රවාසිතාව අවම වීම
3. සංවිධානව ඵලදායිතාවය ඉහළ යාම
4. මනා ශ්‍රමික සම්බන්ධතාවක් වර්ධනය වීම
5. සේවා දායකයින්ට මුහුණ දීමට සිදුවන අනතුරු අවම වීම. (කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

ii.(අ) සේවකයන් සේවයට නොපැමිණීම හා සේවයට පැමිණ සේවය නොසැපයීම නිසා ආයතනයට සේවය අහිමි වී යාම සේවක ප්‍රවාසිතාවය වේ.

(ලකුණු 02)

(ආ)1. එකග වූ අයිතිවාසිකම් හා වරප්‍රසාද ලැබෙන බව තහවුරු වීම
2. කම්කරු අයිතීන් ආරක්ෂා වීම
3. අණපනත්වලින් හිමි වරප්‍රසාද ඉක්මවා යන ප්‍රතාලාභ ලබාගත හැකි වීම.
4. තම අයිතිවාසිකම් මෙන් ම වගකීම් ද පැහැදිලි කර ගැනීමට හැකි වීම.
5. සේවක සුරක්ෂිතභාවය තහවුරු වීම (කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

iii. (අ)

| | දත්ත | තොරතුරු |
|---|---|---|
| 1 | දත්ත යොදවුමකි | තොරතුරු නිමවුකි |
| 2 | දත්ත තීරණ ගැනීම සඳහා සෘජුවම භාවිතා කළ නොහැකිය. | තොරතුරු තීරණ ගැනීමට සෘජුවම භාවිතා කළ හැකිය. |
| 3 | දත්ත දත්ත වඳශයෙන් පවතින තෙක් වටිනාකමක් ගෙන නොදේ. | තොරතුරුවලින් වටිනාකමක් ගෙන දේ. |

(කරුණු 02 ලකුණු 02)

(ආ)1. කළමනාකාරිත්වයට අදාළ තීරණ ගැනීම සඳහා

2. සංවිධානයේ පරමාර්ථ හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා
3. ව්‍යාපාරයේ දෛනික කාර්යය සාර්ථකව හා නිවැරදිව ඉටුකර ගැනීම සඳහා
4. ආයතනයේ ඵලදායීතාවය ඉහළ නංවාලීම සඳහා
5. සම්පත් නාස්තිය අවම කරලීම සඳහා
6. මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදුකර ගෙන යාම සඳහා
7. වැරදි අවම කර ගැනීම හා ගබඩා ඉඩකඩ අවම කර ගැනීම සඳහා

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

iv.(අ)1. ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මගපෙන්වීමට

2. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ට ව්‍යාපාර පිළිබඳ අවබෝධයක් ලබා දීමට
3. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට
4. ව්‍යාරය කරගෙන යාමේ දී ඇතිවිය හැකි ගැටලු විසඳා ගැනීමට
5. විභව ආයොජකයින් ආකර්ශණය කර ගැනීමට

(ලකුණු 1 ඃ 2 = ලකුණු 02)

(ආ) ව්‍යාපෘති සාරාංශය යනු, ඇස්තමේන්තුගත පිරිවැය, ආදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ණය ආපසු ගෙවීමේ සටහන, ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ආදියේ දැක්වෙන තොරතුරුවල සාරාංශගත ලේඛනය වේ. (ලකුණු 02)

v. (අ)1. ව්‍යවසායකයින් පිළිබඳ විස්තර

2. කළමනාකරණ කුසලතා
3. සංවිධාන ව්‍යුහයේ මූලික තනතුරු හා වගකීම්
4. සංවිධාන සටහන
5. වාර්ෂික වියදම

(කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)

(ආ)1. පවත්නා තරගකාරිත්වය

2. තරගකරුවෝ හා ඔවුන්ගේ ශක්තී
3. තරගකාරිත්වයට මුහුණදීමට තමා සතු ශක්ති හා දුර්වලතා
4. වෙළඳපොළට පිවිසීමට ඇති භාධා (කරුණු 04ට ලකුණු 1/2 ඃ 4 = ලකුණු 02)